# 7

# අල් කස්රු – වල් ජම්උ

ඉස්ලාමයේ පංච මහා වගකීම්වලින් සලාතය ඉතා වැදගත් වගකීමකි. සලාතය අත් හැරීමට ඉස්ලාමයේ අනුමැතියක් නොමැත. ගමන් යාම, ලෙඩරෝග, යුද්ධ, භයංකර පරිසරය යනාදී අර්බුදකාරී අවස්ථාවන්හි වුව ද සලාතය ඉටු කළ යුතු ම වේ. එම නිසා ගමනෙහි යෙදෙන අවස්ථාවන්හි දී සලාතය පහසුවෙන් ඉටු කිරීමේ ක්‍රම ඉස්ලාම් දහම හඳුන්වා දී ඇත. ඒවායින් එකක් වන්නේ, **ජම්උ හා කස්රු** සලාත් ය. මෙය එකතු කර හා කෙටි කර ඉටු කරන සලාතයන් වේ.

## එකතු කර ඉටු කිරීම (ජම්උ)

ගමනක යෙදී සිටින්නෙකු දහවල් කාලයේ දී ඉටු කරන සලාතයන් (ලුහර්, අස්ර්) දෙක. එසේ ම රාත්‍රී කාලයේ දී ඉටු කරන සලාතයන් (මඃරිබ්, ඉෂා) යනාදී දෙක ම එක් කර ඉටු කිරීම "ජම්උ" නමින් හැඳින් වේ. මෙම ජම්උ සලාතය පහතින් දැක්වෙන කුමන ආකාරයකින් වුව ද ඉටු කළ හැකි ය.



### ඉදිරියෙන් ඇති සලාතය එකතු කර ඉටු කිරීම (ජම්උ තක්දීම්)

ගමනෙහි යෙදෙන්නේ ලුහර් සලාතය ඉටු කර, ඒ සමග ම අස්ර් සලාතය ද, මඃරිබ් වේලාවේ දී මඃරිබ් සලාතය ඉටු කර, ඒ සමග ම ඉෂා සලාතය ද එකතු කර ඉටු කළ හැකි ය. මෙලෙස සලාත් කිරීම "ජම්උ තක්දීම්" පෙරටු කර එක් කොට සලාතය ඉටු කිරීම නමින් හැඳින් වේ.

### පසුව ඇති සලාතය හා එකතුකර ඉටු කිරීම (ජම්උ තඃකීර්)

ගමනෙහි යෙදෙන්නා ලුහර් සලාතය පසුවට කල් දමා, අස්ර් වෙලාවේ දී, මුලින් ලුහර් සලාතය ඉටුකර, ඒ සමග ම අස්ර් සලාතය ද එසේ ම මඃරිබ් සලාතය පසුවට කල් දමා ඉෂා වෙලාවේ දී මුලින් මඃරිබ් සලාතය ඉටු කර ඉන්පසුව ඉෂා සලාතය ද එකතු කර සලාත් කළ හැකි ය. මෙලෙස සලාත් කිරීම **'ජම්උ තඃකීර්'** නමින් හඳුන්වයි.

### කෙටි කර සලාත් කිරීම (කස්රු)

රක්අත් හතරක සලාතයන් රක්අත් දෙකක් වශයෙන් සලාතය කෙටි කර ඉටු කිරීම 'කස්රු' නමින් හැඳින් වේ. මෙසේ කෙටි කර ඉටු කිරීම ගමනක යෙදෙන්නන්ට පමණක් සීමා වූ වරප්‍රසාදයකි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් තමා යෙදුණු ගමන් බිමන්වල මෙලෙස සලාත් කෙටි කර ඉටු කළහ.

**"ඔබ භූමියෙහි ගමනක් යනවිට (ඔබ) සලාතය කෙටි කර ඉටුකිරීම ඔබ වෙත වරදක් නොවේ"** (අල්කුර්අන් 4:101)

### අල් ජම්උ - වල් කස්රු

රක්අත් 4කින් යුත් සලාතයන් දෙක බැගින් කෙටි කර ජම්උ තක්දීම් ලෙස හෝ ජම්උ තඃකීර් ලෙස ඉටු කළ හැක. නමුත් මඃරිබ් සලාතය විෂයයෙහි එහි රකාඅත් ගණන කිසි දු වෙනසක් නොවේ.

### ජම්උ - කස්රු ඉටු කරන්නන් සැලකිල්ලට ගත යුතු දේ :

01. රක්ආත් හතරක සලාතයන් වන ලුහර්, අස්ර්, ඉෂා සලාත් පමණක් කෙටි කර රක්ආත් දෙකක් ලෙස ඉටු කළ හැකි වේ. මඃරිබ් සලාතයන් කෙටි කර ඉටු කළ නොහැකි ය. නමුත් එකතු කර ඉටු කළ හැකිය. ෆජ්ර් සලාතය කෙටි කර හෝ එකතු කර හෝ ඉටු කළ නොහැකි ය.

02. රක්ආත් හතරක සලාතයන් රක්ආත් දෙකක් ලෙස කස්ර් කරන විට එක් රක්ආත්හි දී සුපුරුදු සේ සූරතුල් ෆාතිහා හා අල්කුර්ආනයේ තවත් වාක්‍යයන් පාරායණය කර පිළිවෙළට ඉටුකළ යුතු ය.

03. කස්රු කිරීමේ මෙම වරප්‍රසාදය ගම් ප්‍රදේශයේ සීමාව ඉක්මවූ විගස ම ඇරඹේ. එමෙන් ම ජම්උ තඃකීර් ඉටුකරන්නා අදාළ සලාතයේ වේලාව ඉක්මවීමට පෙර අනෙක් සලාතය හා එක් කොට ඉටු කරන බවට නියියතය තැබිය යුතු ය.

04. ගමනෙහි යෙදෙන්නා ෆජ්ර්හි සුන්නත් සලාතයන් හා විත්ර් සලාතයන් නොකඩවා ඉටු කිරීම යහපත් ය.

05. ගමනෙහි යෙදෙන්නන් ජම්උ කරන විට සලාත් දෙකකට එක් අදානයක් ද, එකිනෙක සලාතයන් එකිනෙකට වෙන් වෙන් වශයෙන් ඉකාමත් ද කිව හැකි ය.

06. කෙටි කර සලාතය ඉටු කරන්නන්, සලාතය සම්පූර්ණ වශයෙන් ඉටු කරන ඉමාම්වරයා පිළිපැදිය නොහැකි ය.

**අභ්‍යාස**

**පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✕) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

අ) 1. ගමනෙහි යෙදෙන්නෙකුට සලාත් කිරීම අපහසු නම් කලා කළ හැකි ය. ( )

2. ෆජ්ර් සලාතය කෙටි කර හෝ එකතු කර ඉටුකළ නොහැකි ය. ( )

3. 'ජම්උ තක්දීම්' යනු පෙරටු කර සලාත් ඉටු කිරීමයි. ( )

4. ගමනෙහි යෙදෙන්නන් කිසි ම සුන්නත් සලාතයක් ඉටු කිරීම අවශ්‍ය නොවේ. ( )

(ආ) ඔබ ජීවිතයේ කස්රු ජම්උ කළ අත්දැකීමක් කෙටියෙන් විග්‍රහ කරන්න.